# පොළොන්නරු දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික පසුබිම හා විකාශනය



පොළොන්නරුව රාජධානි යුගයෙන් පසුව දිගු කලක් වනගතව තිබූ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ

නවෝදයක් උදා වූයේ දිස්ත්‍රික්කය තුළ වූ වාරිමාර්ග

යෝජනා ක්‍රම නවීකරණය කොට ඒ ආශ්‍රිත ව ඉදිකරන

ලද ගොවිජනපද ව්‍යාපාරයන් නිසා ය. 1933 දී ආරම්භ

කරන ලද මින්නේරිය ගොවිජනපද ව්‍යාපාරය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පමණක් නොව මෙරට ගොවිජන ව්‍යාපාරයේ සහ කෘෂිකාර්මික ක්ෂේත්‍ර යේ ආරම්භක සන්ධිස්ථානයක් ලෙස හැඳින්වීම නිවැරදි ය.

පුරාණ වාරිමාර්ග ලෙස ජරාවාස වී තිබූ මින්නේරිය වැව 1903 දී ප්‍රතිසංස්කරණය කරන ලද අතර, ගිරිතලේ වැව 1905 දී , පරාක්‍රම සමුද්‍රය 1952 දී , කවුඩුළු වැව 1958 දී ද ප්‍රතිසංස්කරණය කරන ලදි.

මෙම ජලාශ සහ ඇලහැර යෝධ ඇළ ආශ්‍රිත ඇලහැර මහා ගොවිජනපදය ආශ්‍රිත ව ගොඩනැඟුණු මහා ගොවිජනපද ජනාවාසයන් නිසා 1933 සිට 1983 දක්වා වූ අඩසියවසක කාලය තුළ පොළොන්නරුව දිස්ත්‍රික්කය විශාල ලෙස සංවර්ධනය විය. 1953 දී ආදායම් නිලධාරි කොට්ඨාස දෙකකින් ආරම්භ වූ පොළොන්නරුව දිස්ත්‍රික්කය වර්තමානයේ දී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07ක ග්‍රාම නිලධාරි වසම් 295කින් සමන්විත වේ. මේ අතර ම ආරම්භ වූ **කඩිනම් මහවැලි ව්‍යාපාරය** යටතේ මහවැලි බි සහ සි කලාප වලට අයත් දිඹුලාගල සහ වැලිකන්ද යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසත් මහවැලි ජී කලාපයේ පිහිටා ඇති ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයත් වඩා වේගවත් ලෙස සංවර්ධනය වන්නට විය.

## දිස්ත්‍රික්කයේ භූගෝලීය පිහිටීම හා භූමි පරිභෝජනය

උතුරු අක්ෂාංශ 7’ 40" - 8’ 21" ත් නැගෙනහිර දේශාංශ 80’ 44" - 8’ 22" අතර පිහිටා ඇති පොළොන්නරුව බලප්‍රදේශය උතුරට කිලෝ මීටර් 274 – 348 ත් අතර සහ නැගෙනහිරට කිලෝ මීටර් 197 – 263 දක්වා විහිදී යයි. පළාත් වශයෙන් ගත් කළ පොළොන්නරුව උතුරු මැද පළාතට අයත් දිස්ත්‍රික්කයකි.

උතුරින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් ද, දකුණින් අම්පාර දිස්ත්‍රික්කයෙන් ද, බටහිරින් අනුරාධපුර සහ මාතලේ දිස්ත්‍රික්කයෙන් ද, නැගෙනහිරින් මඩකලපු දිස්ත්‍රික්කයෙන් ද මායිම් වී ඇත.

| පරිහරණ භූමිය | ප්‍රමාණය වර්ග කි.මී. | ප්‍රතිශතය |
|---|---:|---:|
| ගොඩබිම් ප්‍රමාණය | 3,270.18 | 94.34 |
| අභ්‍යන්තර ජලාශ ප්‍රමාණය | 196.20 | 5.66 |
| **මුළු බිම් ප්‍රමාණය** | **3,466.38** | **100.00** |
| වගා කළ මුළු බිම් ප්‍රමාණය | 862.00 | 24.87 |
| වගා කළ නොකළ මුළු බිම් ප්‍රමාණය | 1,963.94 | 56.65 |
| වනාන්තර මුළු බිම් ප්‍රමාණය | 640.44 | 18.48 |

මූලාශ්‍රය - දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය

### රැකියාවන්ගේ ආංශික බෙදීයාම

| අනු අංකය | ප්‍රා.ලේ. කොට්ඨාසය | රාජ්‍ය අංශය | පෞද්ගලික අංශය | ස්වයං රැකියා - කෘෂි කාර්මික අංශය | ස්වයං රැකියා - කෘෂිකාර්මික නොවන | පතල් වැඩ/වතු වැඩ/කුලී වැඩ | ධීවර කට යුතු | විදේශ රැකියා | එකතුව |
|---|---|---:|---:|---:|---:|---:|---:|---:|---:|
| 01 | තමන්කඩුව | 8686 | 11197 | 9665 | 7100 | 6090 | | 2282 | **45020** |
| 02 | දිඹුලාගල | 5962 | 8215 | 20070 | 4072 | 6092 | **-** | 1019 | **45430** |
| 03 | වැලිකන්ද | 2482 | 1724 | 10275 | 2549 | 3665 | **-** | 856 | **21551** |
| 04 | මැදිරිගිරිය | 4632 | 6974 | 12**124** | **3037** | 5591 | 520 | 1452 | **34330** |
| 05 | ලංකාපුර | 2067 | 4762 | **7514** | **2136** | 2157 | - | 1227 | **19863** |
| 06 | හිඟුරක්ගොඩ | 5192 | 11157 | 7334 | 4303 | 4877 | - | 1337 | **34200** |
| 07 | ඇලහැර | 3099 | 4330 | **13759** | **2011** | 4762 | - | 656 | **28617** |
| | එකතුව | **32120** | **48359** | **80741** | **25208** | **33234** | **520** | **8829** | **229011** |

මූලාශ්‍රය - ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය සම්පත් පැතිකඩ

## දිස්ත්‍රික්කය තුල වී වගාවේ වර්තමාන තත්වය

### වගා කළ කුඹුරු ප්‍රමාණය සහ ඇස්වැන්න - යල

| වර්ෂය | මුළු කුඹුරු ප්‍රමාණය (හෙක්ටයාර්) | වගා කළ කුඹුරු ප්‍රමාණය (හෙක්ටයාර්) | සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාරයට kg) |
|---|---|---|---|
| **2018** යල | 70,741.9 | 61,451 | 5,100 |

මූලාශ්‍රය - දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය

### වගා කළ කුඹුරු ප්‍රමාණය සහ ඇස්වැන්න - මහ

| වර්ෂය | මුළු කුඹුරු ප්‍රමාණය (හෙක්ටයාර්) | වගා කළ කුඹුරු ප්‍රමාණය (හෙක්ටයාර්) | සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාරයට kg) |
|---|---|---|---|
| **2018**/2019 මහ | 70,741.9 | 65,970 | 5,075 |

මූලාශ්‍රය - දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය

### පලතුරු බෝග වගාව ( බෝග වර්ගය අනුව බිම් ප්‍රමාණය හෙක්ටයාර්)

| අනු අංකය | ප්‍රා.ලේ. කොට්ඨාසය | කජු | අඹ | කොස් | දොඩම් | කෙසෙල් | පැපොල් | අන්නාසි | පැෂන් ෆෲට් | කිලෝ පේර | දෙළුම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | තමන්කඩුව | | | | | | | | | | |
| 02 | දිඹුලාගල | 36.2 | 138.63 | 112.9 | 54.28 | 107.84 | 7.25 | 25.48 | - | 7.20 | - |
| 03 | වැලිකන්ද | 41.5 | 162.8 | 03 | 52.9 | 15 | 13.2 | 0.7 | 1.1 | - | - |
| 04 | මැදිරිගිරිය | - | 22 | 04 | - | 8.4 | 05 | - | 0.02 | 0.6 | 1.3 |
| 05 | ලංකාපුර | | 03 | 02 | 01 | 04 | 02 | - | - | | |
| 06 | හිඟුරක්ගොඩ | 1.3 | 1357 | | 1770 | 13.6 | 10.8 | 0.25 | | 870 | |
| 07 | ඇලහැර | 05 | 36.8 | 7.4 | 13.4 | 64 | 13.5 | 0.5 | 0.7 | - | - |
| එකතුව | | **84** | **1720.23** | **129.3** | **1891.58** | **212.84** | **51.75** | **26.93** | **1.82** | **877.8** | **1.3** |

මූලාශ්‍රය - ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය සම්පත් පැතිකඩ

අතිරේක බෝග වගාව

| අනු අංකය | බෝගය | වගා කර ඇති බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | වගා කරන ලද ප්‍රදේශ | සාමාන්‍ය අස්වැන්න (මෙ.ටො./ හෙක්ටයාර්) |
|---|---|---|---|---|
| 01 | බී ළූණු | 15.52 | දිස්ත්‍රික්කය පුරා | 15.0 |
| 02 | උඳු | 9.95 | | 1.0 |
| 03 | අමු මිරිස් | 81.31 | | 0.9 |
| 04 | කවුපි | 35.9 | | 1.4 |
| 05 | කුරක්කන් | 14.32 | | 1.0 |
| 06 | තල | 9.19 | | 2.4 |
| 07 | මුං | 89 | | 1.4 |
| 08 | රටකජු | 174.16 | | 2.0 |
| 09 | බඩඉරිඟු | 235.37 | | 4.0 |
| 10 | රතු ළූණු | 0.08 | | 12.0 |

මූලාශ්‍රය - නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලය

එළවළු බෝග වගාව

| අනු අංකය | බෝගය | වගා කර ඇති බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | වගා කරන ලද ප්‍රදේශ | සාමාන්‍ය අස්වැන්න (මෙ.ටො./ හෙක්ටයාර්) |
|---|---|---|---|---|
| 01 | බෝංචි | 5.74 | දිස්ත්‍රික්කය පුරා | 15 |
| 02 | මාළු මිරිස් | 20.4 | | 12 |
| 03 | වට්ටක්කා | 34.32 | | 25 |
| 04 | පතෝල | 18.83 | | 20 |
| 05 | තක්කාලි | 14.72 | | 30 |
| 06 | පිපිඤ්ඤා | 18.33 | | 25 |
| 07 | බණ්ඩක්කා | 49.72 | | 12 |
| 08 | වම්බටු | 51.05 | | 30 |
| 09 | වැටකොළු | 39.52 | | 30 |
| 10 | මෑකරල් | 79.85 | | 12 |
| 11 | දඹල | 12.55 | | 18 |
| 12 | බුෂිටා | 2.92 | | 15 |
| 13 | කැකිරි | 68.91 | | 25 |
| 14 | එළබටු | 4.47 | | 15 |
| 15 | තිබ්බටු | 6.04 | | 12 |
| 16 | කරවිල | 16.64 | | 20 |

## දිස්ත්‍රික් කෘෂිකර්ම අංශයේ කාර්යයභාරය

**දැක්ම** - පොළොන්නරුව දිස්ත්‍රික්කය කෘෂිකාර්මික වශයෙන් සෞභාග්‍යමත් දිස්ත්‍රික්කය බවට පත් කිරිම.

**මෙහෙවර** - ඉහත දැක්ම සාක්ෂාත් කර ගැනිම සඳහා අදාල ආංශික ආයතන සම්බන්ධීකරණය, කෘෂිකාර්මික උපදෙස් අවශ්‍යතා ඇති අය සඳහා මාර්ගෝපදේශණය සැපයීම,කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම , අස්වනු කළමණාකරණය සඳහා සහය විම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ අනෙකුත් විවිධ කටයුතු ඉටුකිරිම.

**ව්‍යුහය** - දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ

↓

සංවර්ධන නිලධාරි 01

සංවර්ධන නිලධාරි 02

සංවර්ධන නිලධාරි 03

සංවර්ධන නිලධාරි 04

සංවර්ධන නිලධාරි 05

සංවර්ධන නිලධාරි 06

↓

කාර්යාල කාර්ය්‍යා සහයක

කාර්යාභාරය-

මේ අනුව 2021 වර්ෂයේ පොළොන්නරුව දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය වශයෙන් පහත වැඩ සටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වේ.

- 2019/20 මහ වී තොග බැහැර කිරීමේ වැඩසටහන.
- 2020 යල කන්නයේ වි තොග බැහැර කිරීමේ වැඩසටහන.
- 2020/2021 මහ කන්නයේ වි මිල දි ගැනිමේ වැඩසටහන.
- පාසල් තුරු උයන් වැඩසටහන.
- ගෘහ ආර්ථික ඒකක දස ලක්ෂයේ වැඩසටහන.
- පොල් පැල දස ලක්ෂයක් සිටුවීමේ වැඩසටහන
- දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සම්බන්ධීකරණය
- කොවිඩ් 19 වසංගත තත්වය තුල ලෝක බැංකු අධාර යටතේ අතිරේක භෝග වගා සඳහා ගබඩා සහසුකම් ලබාදීම.
- රජයේ ප්‍රමිතීන් වලට අනුව දිස්ත්‍රික්කයේ කාබනික පොහොර නිශ්පාදනය හා භාවිතය සම්බන්ධ වැඩසටහන්.